# සිංහල භාෂාව හා සාහිත්‍යය

## 6 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශය

(2015 සිට ක්‍රියාත්මක වේ.)



සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.
www.nie.lk

# සිංහල භාෂාව හා සාහිත්‍යය

## ගුරු මාර්ගෝපදේශය

## 6 ශ්‍රේණිය

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

සිංහල භාෂාව හා සාහිත්‍යය

6 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2015

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN : .........................

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය : www. nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය :

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හයවන සහ දහවන ශ්‍රේණි සඳහා හඳුන්වාදීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම්වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනාදි අංශ සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශය ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශය උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙ මගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නො වේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායීවීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීමෙන් වැඩ ලෝකයට අවශ්‍ය වන නිපුණතා හා කුසලතාවලින් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ මගින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශවල ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් පෙළ පොත හා ගුරු මාර්ගෝපදේශ යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

## විෂයමාලා කමිටුව

උපදේශකත්වය හා අනුමැතිය : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,
ජාතික අධ්‍යාපන ආයතනය.

විෂය විශේෂඥ උපදෙස් : මහාචාර්ය රත්නසිරි අරංගල,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
නුගේගොඩ.

මහාචාර්ය ජයන්ත අමරසිංහ,
රුහුණු විශ්වවිද්‍යාලය,
මාතර.

සම්බන්ධීකරණය : පූජ්‍ය කුකුරම්පොල ඥාණවිමල හිමි,
කථිකාචාර්ය.
ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර,
කථිකාචාර්ය.

ලේඛක මණ්ඩලය : ඩී.ඩබ්. දිසානායක,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර,
කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

පූජ්‍ය කුකුරම්පොල ඥාණවිමල හිමි,
කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

එම්. ජී. මුණසිංහ,
කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

තිලිනි රත්නායක,
කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

ඩබ්ලිව්. පී. මංගල ගුණරත්න,
සහකාර කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

පී. ඒ. ඩී. රුවනි සිසිජා,
සහකාර කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය ඉගැන්වීමේ ක්‍රියාවලිය සාර්ථක ව ඉටු කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීමේ අරමුණින් මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කර ඇත. ගුරු මාර්ගෝපදේශ භාවිත කිරීමට පෙර, දී ඇති උපදෙස් කියවා එය භාවිත කරන ආකාරය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගත යුතු වේ.

නිපුණතා පාදක විෂයමාලාවක් යටතේ ඉදිරිපත් කර ඇති මෙම විෂය නිර්දේශය නිපුණතා, නිපුණතා මට්ටම්, කාලච්ඡේද, ඉගෙනුම් පල, පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඇගයීම හා තක්සේරුකරණය ගුණාත්මක යෙදුම් යන මූලික අංගවලින් සමන්විත ය. ඉදිරිපත් කර ඇති සෑම පාඩමක් සඳහා ම පොදුවේ කාලච්ඡේද සංඛ්‍යාවක් දක්වා ඇතත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමේ දී එදිනෙදා පාඩම් සඳහා පාඩම් සැලසුමක් ඔබ විසින් සකස් කර ගත යුතු ය. ශිෂ්‍යයාගේ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය වන පරිදි විවිධ ඉගෙනුම් අවස්ථා නිර්මාණය කර ඉදිරිපත් කිරීමට ගුරුභවතුන් යොමු විය යුතු ය. ශිෂ්‍යයාට විවිධ වූ ඉගෙනුම් අත්දැකීම් ලබා ගත හැකි වන පරිදි පාඩම් සැලසුම් කර ගැනීම අවශ්‍ය ය. ගුණාත්මක යෙදවුම් යටතේ ඉදිරිපත් කර ඇති පොත පත ගුරුවරයාගේ පරිශීලනය සඳහා ය. නමුත් එම පොත පත අතුරෙන් ශිෂ්‍යයාට සුදුසු පොත් පත් හඳුනා ගෙන ඒවා කියවීමට ශිෂ්‍යයන් යොමු කළ හැකි ය.

ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා මෙහි ඇතුළත් කර ඇති ක්‍රමවේදවලට අමතර ව ශිෂ්‍යයාට ඉගෙනීම සඳහා ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරයක් පන්තියේ නිර්මාණය කළ හැකි ය. ශිෂ්‍යයන්ගේ නිර්මාණශීලී කුසලතා හඳුනාගෙන ඒවා වර්ධනය කර ගැනීමට අවස්ථාව සැලැස්වීම ද වැදගත් වේ. මේ සඳහා පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කරන දේශන වාද විවාද සාකච්ඡා ප්‍රදර්ශන ක්ෂේත්‍ර චාරිකා ගවේෂණ ආදි විවිධ වැඩසටහන් යොදා ගත හැකි ය.

නූතන තාක්ෂණයේ දියුණුවත් සමග ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ද තාක්ෂණය හා බද්ධ කර ගැනීමේ අවශ්‍යතාව පැන නැගී ඇත. හැකි සෑම අවස්ථාවක දී ම නූතන තාක්ෂණය ඉගෙනුම් ඉගැන්වීම් සඳහා යොදා ගැනීම උචිත ය.

සෑම නිපුණතා මට්ටමක් සඳහා ම දී ඇති උපදෙස් අවසානයේ ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලිය සඳහා නිර්ණායක ඉදිරිපත් කර ඇත. එම නිර්ණායක මැනෙන පරිදි සුදුසු ඇගයීම් වැඩ පිළිවෙළක් සකසා ගැනීම සුදුසු ය.

මෙහි දක්වා ඇති උපදෙස් හා ඔබේ අත්දැකීම් පාදක කර ගනිමින් ශිෂ්‍යයන්ට උචිත ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රම නිර්මාණය කර ගැනීමට පූර්ණ අවකාශය මෙ මගින් සලසා ඇත. මේ සඳහා මෙම ගුරු මාර්ගෝපදේශය ඔබට අත්වැලක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ලේඛක මණ්ඩලය

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi |
| පටුන | vii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | viii - xxvi |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 -33 |

# සිංහල භාෂාව හා සාහිත්‍යය

## විෂය නිර්දේශය

## 6 ශ්‍රේණිය

(2015 සිට ක්‍රියාත්මක වේ.)

සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
භාෂා මානව හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.

විෂය විශේෂඥ සහාය

මහාචාර්ය රත්නසිරි අරංගල ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, නුගේගොඩ
මහාචාර්ය ජයන්ත අමරසිංහ රුහුණු විශ්ව විද්‍යාලය, මාතර

විෂය නිර්දේශ කමිටුව
එස්. ඒ. පේමසිරි මහතා, ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ, සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර මහතා, කථිකාචාර්ය, සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

පූජ්‍ය කුකුරම්පොළ ඥාණවිමල හිමි, කථිකාචාර්ය, සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

එම්. ජී. මුණසිංහ මහතා, කථිකාචාර්ය, සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

පී. ටී. එම්. රත්නායක මහත්මිය, කථිකාචාර්ය, සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

ඩබ්ලිව්. පී. මංගල ගුණරත්න මහතා, සහකාර කථිකාචාර්ය, සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

පී. ඒ. ඩී. රුවනි සිසිජා කල්දේරා මහත්මිය, සහකාර කථිකාචාර්ය, සිංහල
දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

එස්. ඕ. ප්‍රනාන්දු මහතා, අධ්‍යක්ෂ (විශ්‍රාමික) ජාතික අධ්‍යාපන ආයතනය.

එච්. එල්. එස්. අබේවික්‍රම මහත්මිය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ,
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය

ප්‍රගීතිකා ජයසේකර මහත්මිය, සහකාර කොමසාරිස්
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය.

එච්. පී. සුසිල් සිරිසේන මහතා, කථිකාචාර්ය, හාපිටිගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය,
මීරිගම

ස්වර්ණා වීරසිංහ මහත්මිය, ගුරු උපදේශිකා කලාප අධ්‍යාපන කාර්යාලය
කැලණිය

වයි. පී. එන්. පී. විමලසිරි මිය, ගුරු උපදේශිකා, කලාප අධ්‍යාපන කාර්යාලය ,
ජයවර්ධනපුර

ගයා වැයිහේන මහතා, ගුරු උපදේශක, කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පාදුක්ක

සුනිල් බියන්විල මහතා, ගුරුසේවය ගිරි/වික්‍රමශිලා ජාතික පාසල, ගිරිඋල්ල.

අරුණ ඉන්දික වේරගල මහතා, ගුරු සේවය. කො/ආනන්ද බාලිකා විද්‍යාලය
කොළඹ 10.

# පටුන

පිටු අංක


| | | |
|---|---|---|
| 1. | හැඳින්වීම | xi |
| 2. | ජාතික පොදු අරමුණු | xii |
| 3. | මූලික නිපුණතා | xiii-xiv |
| 4. | විෂය අරමුණු | xv |
| 5. | විෂය නිර්දේශය | xvi-xxx |

හැඳින්වීම

අනාගත ලෝකයේ අභියෝග ජයගැනීමට සමත් දරු පරපුරක් රටට දායාද කිරීමේ කාර්ය භාරයේ වැඩි වගකීම හිමිවන්නේ අධ්‍යාපනයට ය. ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන දැනුම උකහා ගැනීම සඳහා අවශ්‍ය භාෂා කුසලතා සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. සිංහල භාෂාව, ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන මාධ්‍ය භාෂාව වේ. සිංහල භාෂාව ඇතුළු ව අනෙකුත් විෂය හැදෑරීම සඳහා සිංහල භාෂාව පිළිබඳ නිවැරදි දැනුම අත්‍යවශ්‍ය ය. භාෂාවේ චතුර්විධ කුසලතා වර්ධනය කර ගැනීමෙන් විෂය සාධන මට්ටම ඉහළ තලයකට නංවාලිය හැකි ය. සියලු විෂයන්හි සාධන මට්ටම වර්ධනය සඳහා භාෂා දැනුම අවශ්‍ය හෙයින් සිංහල භාෂාව පිළිබඳ කුසලතා සංවර්ධනය කිරීම මවුබස සිංහල විෂයේ වගකීමක් ලෙස හඳුනා ගෙන ඇත.

සිංහල භාෂාව සියවස් ගණනාවක් තුළ වැඩෙමින් විකාශනය වූ භාෂාවකි. ඒ නිසා ම එහි විවිධ වාක්‍ය රීති මෙන් ම භාෂා ව්‍යවහාර ද දක්නට ලැබේ. ඒවා අධ්‍යයනය කිරීමෙන් භාෂා මාමාකත්වයෙන් යුතු ව කටයුතු කිරීමට යොමු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සිංහල සාහිත්‍යය, සිංහල භාෂා විෂය සමග ඒකාබද්ධ වූ විෂය කොටසකි. දයාව, කරුණාව ආදි මානව ගුණධර්මවලින් හෙබි සුබනම්‍ය මනසකින් හා සමබර පෞරුෂයකින් යුතු සංවේදී දරු පරපුරක් බිහි කිරීම සඳහාත් සාහිත්‍ය සේවනය අත්‍යවශ්‍ය සාධකයෙකි.

නව විෂය නිර්දේශය සකස් කිරීම සඳහා දැනට ක්‍රියාත්මක විෂය නිර්දේශය පාදක කරගෙන ඇත. ඒ අනුව නව විෂය නිර්දේශය ද නිපුණතා පාදක ව ඉදිරිපත් කෙරේ. මෙම විෂය නිර්දේශය සකස් කිරීමේ දී ආචාර්ය රෙනෝල්ඩ්ස් මහත්මියගේ සහ ආචාර්ය සෙනරත් නානායක්කාර මහතාගේ ශ්‍රී ලංකාවේ 6 - 9 ශ්‍රේණි සඳහා විෂය ප්‍රමිති රාමුව (Standards for grade 6 - 9 subjects in Sri Lankan Schools. Author Dr. Janet Reynolds Dr. Senarath Nanayakkara) නමැති ලේඛනයේ ඇතැම් අංග උචිත පරිදි යොදා ගෙන ඇත.

ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහය විය යුතුය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලිය තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනයෙන් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීමෙන් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන මගින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

## මූලික නිපුණතා

අධ්‍යාපනය මගින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත

### (I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම

### (II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

### (III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරයට ජාතික උරුමය පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම,
යන හැකියා උපරි ම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාව මගින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.1 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි. | 1.1 සාහිත්‍ය නිර්මාණයකට සවන් දී ප්‍රතිචාර දක්වයි. | • කතාන්දරයකට සවන් දී ප්‍රතිචාර දැක්වීම<br>" නරි නයිදේ රැවටිච්චි'<br>(වටු කිරිල්ලී - ඒ. පී. ගුණරත්න) | • සවන් දී අදහස් ඉදිරිපත් කරයි.<br>• සවන් දී මතකයේ රඳවාගත් කරුණු ප්‍රකාශ කරයි.<br>• සවන් දී අවබෝධයෙන් යුතු ව පිළිතුරු සපයයි. | 05 |
| | 1.2 සවන් දී ප්‍රතිචාර දැක්වීමේ දී ආචාරශීලී බව හා සංයමය ප්‍රදර්ශනය කරයි. | • පුද්ගලයන් අතර සිදු වන කතාබහ<br>උදා :<br>- දෙමව්පියන්<br>- ඥාතීන්<br>- මිතුරන්<br>- පූජ්‍ය පක්ෂය | • පුද්ගල විවිධත්වය අනුව භාෂා ස්වරූපය වෙනස් වන බව ප්‍රකාශ කරයි.<br>• සමාජ පරිසරය අනුව භාෂා ස්වරූපයේ වෙනස්කම් පැහැදිලි කරයි.<br>• පුද්ගල විවිධත්වය හා සමාජ පරිසරය අනුව ආචාරශීලී ව හා සංයමයෙන් යුතු ව භාෂාව හසුරුවයි. | 05 |
| | 1.3 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රස විඳියි. | • ළමා කවි<br>උදය සිරි - එස් මහින්ද හිමි<br>වැස්ස වගේ ආකාසෙන්<br>- ඩබ්. ඒ. අබේසිංහ | • පද්‍ය පන්තියට අවධානයෙන් සවන් දී අදහස් ඉදිරිපත් කරයි.<br>• පද්‍ය පන්තියේ තේමාව හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• පද්‍ය පන්තිය පිළිබඳ තම අදහස් ඉදිරිපත් කරයි.<br>• වෙනත් පද්‍ය නිර්මාණ රස විඳීමට පෙලඹෙයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.4 සාවධාන ව සවන් දී තොරතුරු රැස් කරයි. | • ගුවන් විදුලි විචිත්‍රාංග වැඩසටහනක් ගුවන් විදුලි මාධ්‍යයෙන් ප්‍රචාරය වූ වැඩ සටහන් අතරින් තෝරාගත් යෝග්‍ය වැඩ සටහනක පිටපතක් ඇසුරෙන් | • අවධානයෙන් යුතු ව සවන් දී තොරතුරු රැස් කරයි.<br>• සවන් දී මතකයේ රඳවාගත් තොරතුරු ප්‍රකාශ කරයි.<br>• වැදගත් තොරතුරු සටහන් කර ගනියි.<br>• රැස් කරගත් තොරතුරු අවස්ථෝචිත ව යොදා ගනියි. | 05 |
| | 1.6 නිරවුල් හා නිවැරදි ලෙස බස හසුරුවමින් හඬ පාලනයෙන් යුතු ව කතා කරයි. | සරල මාතෘකානුකූල කතා | • සබකෝලයෙන් තොර ව කතා කරයි.<br>• අන්‍යයන්ගේ අවධානය දිනා ගනිමින් කතා කරයි.<br>• නිරවුල් ව හා පැහැදිලි ව තම අදහස් ප්‍රකාශ කරයි. | 05 |
| 2.0<br>ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි. | 2.1 නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවයි. | • ළමා කතන්දරයක්<br>- අලි උවදුර - කියවන නුවණ<br>කුමාරතුංග මුනිදාස<br>ශබ්දෝච්ඡාරණය සඳහා ක්‍රියාකාරකම්<br>- සකස්කඩ | • නිවැරදි හා පැහැදිලි උච්චාරණයෙන් යුතු ව කියවයි.<br>• නිසි හඬපාලනයෙන් යුතු ව කියවයි.<br>• විරාම ලක්ෂණ කෙරෙහි සැලකිලිමත් වෙමින් කියවයි.<br>• අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි. | 05 |
| | 2.2 විවිධ ශෛලි අනුගමනය කරමින් රචිත පොතපත කියවයි. | • ජාතක කතාවක් ශ්‍රැති ගෝචර රටාවෙන් කියවීම.<br>නලපාන ජාතකය<br>- වේදිකා නාට්‍යයක කොටසක් චරිතාරෝපිත ව කියවීම<br>- නරි බැනා නාට්‍යයෙන් කොටසක් (ක්‍රියාකාරකම් සඳහා) | • විවිධ ශෛලි හඳුනා ගෙන කියවයි.<br>• උචිත ශෛලියකට අනුගත ව කියවයි.<br>• විවිධ ශෛලිවලට අනුව ලියවුණු පොතපත රස මතුවන අයුරින් කියවයි.<br>• විවිධ ශෛලිවලට අනුව කියවීමෙන් රස ජනනය වන බව අගය කර | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.3 නිශ්ශබ්ද ව කියවා අවබෝධ කරගත් කරුණු ඉදිරිපත් කරයි. | • 'ඇවිදින කොළයා'<br>- විද්‍යා විනෝද කතා<br>මාර්ටින් වික්‍රමසිංහ | • පොතපත කියවා තොරතුරු රැස් කරයි.<br>• අර්ථාවබෝධයෙන් යුතු ව කියවා පාරිභාෂික වචන පැහැදිලි කරයි.<br>• කියවීමෙන් ග්‍රහණය කරගත් තොරතුරු ඉදිරිපත් කරයි.<br>• විවිධ පොත පත කියවීමේ පුරුදු අගය කරයි. | 05 |
| 3.0<br>සිංහල අක්ෂරමාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි. | 3.1 සිංහල අක්ෂරමාලාව හඳුනා ගෙන විවිධ ප්‍රභේද යටතේ වර්ග කරයි. | • සිංහල අක්ෂරමාලාව<br>• සිංහල අක්ෂරමාලාව නිවැරදි ව අනුපිළිවෙළින් හඳුනා ගැනීම හා අකුරු නිවැරදි රූපාකාරයෙන් ලිවීම.<br>• පිල්ලම් හඳුනා ගැනීම. | • සිංහල අක්ෂරමාලාව නිවැරදි ව අනුපිළිවෙළින් ලියා දක්වයි.<br>• අකුරු නිවැරදි ප්‍රමාණයෙන් හා නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි.<br>• පිල්ලම් හඳුනා ගෙන නිවැරදි ව භාවිත කරයි. | 05 |
| | 3.3 නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි. | • න, ණ, ල, ළ භාවිතය<br>(එක ම හඬ ඇති ශබ්ද සඳහා විවිධ රූප ඇති බව.)<br>- අල්ප්‍රාණ, මහාප්‍රාණ භාවිතය, සඤ්ඤක අක්ෂර නිවැරදි ව වචනවල යෙදීම. | • න, ණ, ල, ළ අක්ෂර වචනවල නිවැරදි ව යොදයි.<br>• අල්පප්‍රාණ හා මහාප්‍රාණ අක්ෂර නිවැරදි ව යොදයි.<br>• සඤ්ඤක අක්ෂර අර්ථවත් ලෙස භාවිත කරයි.<br>• අක්ෂර වින්‍යාසය පිළිබඳ දැනුම ලේඛනයේ දී ඉවහල් කර ගනියි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0<br>ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් නිවැරදි ව ලේඛන කාර්යයේ යෙදෙයි. | 4.1 විරාම ලකුණු නිවැරදි ව භාවිත කරමින් ලියයි. | ● ලේඛනයේ දී විරාම ලකුණු නිවැරදි ව භාවිත කිරීම.<br>තිත, කොමාව, ප්‍රශ්නාර්ථ ලකුණ, විස්මයාදි ලකුණ තනි උඩුකොමාව, යුගල උඩුකොමා | ● විරාම ලකුණු නිවැරදි ව හඳුනා ගෙන නම් කරයි.<br>● ලේඛනයේ දී විරාම ලකුණු අර්ථවත් ව භාවිත කරයි.<br>● විරාම ලකුණු නිවැරදි ව යෙදීමේ අගය කරයි. | 05 |
| | 4.2 පද බෙදීමේ රීති අනුගමනය කරමින් ලියයි. | ● පද හඳුනා ගැනීම හා ඒවා නිවැරදි ව වාක්‍යවල යෙදීම.<br>- නාම පද<br>- ක්‍රියා පද<br>- නිපාත පද | ● නාම පද, ක්‍රියා පද හා නිපාත පද හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>● පද බෙදීමේ දී නාම, ක්‍රියා, නිපාත වෙන් කොට ලියයි.<br>● ලේඛනයේ දී නිවැරදි ව පද බෙදා ලිවිය යුතු බව පිළිගනියි. | 04 |
| 5.0<br>භාෂාමය කාර්යයේ දී වාක් කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි. | 5.1 වාක් කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි. | ● සමානාර්ථ පද<br>● විරුද්ධාර්ථ පද<br>● විශේෂණ පද | ● සමානාර්ථවත් පද, විරුද්ධාර්ථවත් පද, විශේෂණ පද හඳුනාගෙන නම් කරයි.<br>● ලේඛනයේ දී සමානාර්ථවත්, විරුද්ධාර්ථවත්, විශේෂණ පද නිවැරදි ව ලියයි.<br>● පුළුල් කර ගත් වාක් කෝෂීය හැකියාව අගය කරයි. | 06 |
| | 5.2<br>සාම්ප්‍රදායික යෙදුම් භාෂාමය කාර්යයේ දී උචිත පරිදි භාවිත කරයි. | ● ප්‍රස්තාව පිරුළු<br>කතාව සහිත පිරුළු 3ක්<br>(සිංහල පිරුළු සාහිත්‍යය කෘතිය ඇසුරෙන්) | ● ප්‍රස්තාව පිරුළු හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● ප්‍රස්තාව පිරුළු සම්බන්ධ කතා ඉදිරිපත් කරයි.<br>● ලේඛනයේ දී මෙන් ම කථනයේ දී ද උචිත පරිදි ප්‍රස්තාව පිරුළු භාවිත කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0<br>සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 6.1 නාම පද සහ එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි. | • වචන භේදය<br>• පුරුෂ භේදය<br>• ලිංග භේදය<br>• උක්ත, අනුක්ත භේදය | • නාම පදවල වචන භේදය, පුරුෂ භේදය, ලිංග භේදය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නාම පදවල උක්ත අනුක්ත භේදය හඳුනාගෙන විස්තර කරයි.<br>• වාක්‍ය නිර්මාණයේ දී උක්ත අනුක්ත නාම පද නිවැරදිව යොදයි.<br>• ප්‍රායෝගික භාෂා කාර්යයේ දී නාම පද පිළිබඳ දැනුම භාවිත කරයි. | 05 |
| | 6.2 ක්‍රියා පද සහ එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි. | • වචන භේදය<br>• පුරුෂ භේදය<br>• ලිංග භේදය<br>• කාල භේදය | • වචන, පුරුෂ, ලිංග හා කාල වශයෙන් ක්‍රියා පද වර්ග කරයි.<br>• ක්‍රියා පදවල වචන භේදය, පුරුෂ භේදය, ලිංග භේදය, කාල භේදය හඳුනා ගෙන ලියයි.<br>• ප්‍රායෝගික භාෂා කාර්යයේ දී ක්‍රියා පද පිළිබඳ දැනුම නිවැරදි ව භාවිත කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.5 සම්මත රීතිවලට අනුගත ව වාක්‍ය ලියයි. | • වචන භේදය<br>පුරුෂ භේදය<br>ලිංග භේදය<br>කාල භේදය<br>අනුව වාක්‍ය නිර්මාණය. | • නාම පදයේ හා ක්‍රියා පදයේ වචන භේදය, පුරුෂ භේදය, ලිංග භේදය හා කාල භේදය අනුව වාක්‍ය නිර්මාණය කරයි.<br>• නිවැරදි වාක්‍ය රීති භාවිතයේ වැදගත්කම අගය කරයි.<br>• උක්තය, කර්මය, ආඛ්‍යාතය කෙරෙහි අවධානයෙන් යුතු ව වාක්‍ය නිර්මාණය කරයි. | 08 |
| 7.0<br>භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි. | 7.1 තොරතුරු සන්නිවේදනය සඳහා ලිපි ලියයි. | • පෞද්ගලික ලිපි | • පෞද්ගලික ලිපියක ආකෘතිය හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>• පෞද්ගලික ලිපියක ආකෘතිය අනුගමනය කරමින් ලිපි ලියයි.<br>• ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් ලිපි ලියයි.<br>• ලිපි ලිවීම පිළිබඳ නිවැරදි දැනුම භාවිත කරයි. | 04 |
| | 7.2 ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ලේඛන සකස් කරයි. | • සුබ පැතුම් පත් | • සුබ පැතුම් පතක මූලික ලක්ෂණ හඳුන්වයි.<br>• මූලික ලක්ෂණ භාවිත කරමින් සුබ පැතුම් පතක් නිර්මාණය කරයි.<br>• සුබ පැතුම් පත් නිර්මාණයේ දී උචිත ශිල්පීය ප්‍රයෝග භාවිත කරයි.<br>• නිර්මාණාත්මක ලක්ෂණ ඉස්මතු කරමින් සුබ පැතුම් පත් නිර්මාණය කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0<br>භාෂාව නිරවුල් ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි. | 8.1 කරුණු සංවිධානය කර ගනිමින් මාතෘකානුකූල ව රචනා ලියයි. | • මාතෘකානුකූල රචනා | • රචනා ලිවීම සඳහා සුදුසු මාතෘකා තෝරා ගනියි.<br>• මාතෘකාවට අනුව රචනාවට සුදුසු ආකෘතියක් ගොඩ නගයි.<br>• විචාරාත්මක විමර්ශනාත්මක හා ගවේෂණාත්මක මාතෘකාවලට අදාළ ව කරුණු සංවිධානය කරමින් රචනා ලියයි.<br>• රචනා ලිවීමේ දී භාෂා ව්‍යවහාරය උචිත පරිදි යොදා ගනියි.<br>• ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් රචනා ලියයි. | 04 |
| | 8.2 පාඨකයා ආකර්ෂණය වන පරිදි අදහස් ඉදිරිපත් කරමින් නිර්මාණාත්මක ව ලියයි. | • බිත්ති පුවත්පත් ලිපි<br>• සඟරා ලිපි | • බිත්ති පුවත් පත් හා සඟරා ලිපිවල විශේෂ ලක්ෂණ හඳුනාගෙන විස්තර කරයි.<br>• නිවැරදි ව හා නිරවුල් ව අදහස් ඉදිරිපත් කරමින් බිත්ති පුවත් පත් හා සඟරා ලිපි ලියයි.<br>• ආකර්ෂණීය ලෙස කරුණු ඉදිරිපත් කරමින් ලේඛනයේ යෙදෙයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0<br>සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි. | 9.1 සංස්කෘතික උරුමය හා හර පද්ධති පිළිබඳ ව අවබෝධය ලබා ගැනීම සඳහා කියවයි. | • වාරි කාර්මාන්ත ගැන ලියැවුණු නිර්මාණයක්<br>- බ්‍රෝහියර් දුටු ශ්‍රී ලංකාව කෘතිය ඇසුරින් (පරිවර්තනය - අගය හේවාවසම්) | • වැව හා බැඳුණු සංස්කෘතික තොරතුරු රැස් කරයි.<br>• වැව හා බැඳුණු සංස්කෘතික උරුමය සම්බන්ධ දැනුම නිර්මාණ කාර්යයේ දී හා අධ්‍යයන කටයුතුවල දී යොදා ගනියි.<br>• වැව හා බැඳුණු සංස්කෘතිය අගය කරයි. | 05 |
| | 9.2 පොතපත පරිශීලනයෙන් සාරධර්ම වර්ධනය කර ගනියි. | • සාරධර්ම පිළිබඳ ලියැවුණු නිර්මාණයක්<br>- සිරිත් මල්දම | • කවි පෙළ කියවා යහ පුරුදු යනු මොනවා දැයි විස්තර කරයි.<br>• යහපත් සිරිත් රැක ගැනීමේ වටිනාකම අගයමින් කතා කරයි.<br>• යහ සිරිත් අනුගමනය කරයි. | 04 |
| | 9.3 දේශාභිමානි හැඟීම් දනවන සාහිත්‍ය නිර්මාණ ඇසුරු කරයි. | • දේශාභිමානි ගී<br>වාසනාවන්<br>ඩබ්. ඒ. අබේසිංහ | • දේශාභිමානී ගීතයෙන් ප්‍රකාශ වන අදහස් සරල ව පැහැදිලි කරයි.<br>• ගීතයෙන් ගම්‍යවන දේශාභිමානී අදහස් අගය කරයි.<br>• ගීතයේ ඇතුළත් කාව්‍යෝපක්‍රම පිළිබඳව අදහස් ප්‍රකාශ කරයි.<br>• දේශාභිමානී සාහිත්‍ය නිර්මාණ රසාස්වාදය කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.4 විවිධ ජන කොටස්වලට අයත් සිරිත් විරිත් හඳුනා ගැනීම සඳහා කියවයි. | • ශ්‍රී ලංකාවේ ආදි වාසීන් වැදි ජන ජීවිතය/ඇදහිලි විශ්වාස<br><br>("වැද්දන්ගේ විකාශන ක්‍රමය" නන්දදේව විජේසේකර කෘතිය හෝ "සිරිලක වැදි ජන පුරාණය" පී. බී. මීගස්කුඹුර කෘතිය හෝ ඇසුරෙන්) | • දේශීය ජන වර්ග හඳුනාගෙන නම් කරයි.<br>• වැදි ජනතාවගේ සංස්කෘතික ලක්ෂණ හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>• විවිධ සංස්කෘතිවලට ගරු කිරීමට පෙලඹෙයි. | 05 |
| 10.0<br>සාහිත්‍යික දාර්ශනික විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් ලිපි ලේඛන පරිශීලනයෙන් ලබාගත් දැනුම විවිධ භාෂා කාර්ය සඳහා යොදා ගනියි. | 10.1 සාහිත්‍යික හා දාර්ශනික තොරතුරු ඇතුළත් ලිපි ලේඛන ඇසුරු කරයි. | • කේ. ජයතිලක මහතාගේ චරිතය (ළමා කාලය) "පුංචි පැලේ ගස වෙනා" කෘතිය ඇසුරෙන් | • සාහිත්‍යකරුවා පිළිබඳ හඳුනාගත් තොරතුරු ඉදිරිපත් කරයි.<br>• ලේඛකයාගේ ජීවිතය හා සම්බන්ධ වැදගත් තොරතුරු හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>• ලේඛකයකු වශයෙන් ඔහුගේ කුසලතා හඳුනාගෙන අගය කරයි.<br>• සාහිත්‍යකරුවාගේ චරිතයෙන් ලබාගත හැකි ආදර්ශ නම් කරයි. | 05 |
| | 10.2 දැනුම ලබා ගැනීම සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් පොතපත කියවයි. | • අතීත ශ්‍රී ලංකාවේ ආහාර තාක්ෂණය පිළිබඳ ලියවුණු නිර්මාණයක් | • ලාංකිකයන් සතු ආහාර තාක්ෂණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• පැරණි ආහාර වර්ග හා ඒ සම්බන්ධ සිරිත්, ජීවන රටා හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>• ආහාර හා සම්බන්ධ භාෂාත්මක යෙදුම් හඳුනාගෙන භාවිත කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 11.0<br>රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි. | 11.1 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් හඳුනාගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි. | ● කවි/ගීත/නාට්‍ය/ජනකවි/ජනකතා<br>- "රාසිංදෙයියන්ට බැණ වැදුණු මුරකරුවා" ජන කතාව ("මග දිගට ජනකතා" කෘතිය - ඩී. ජී. වික්‍රමසිංහ)<br>- කාව්‍යශේඛරය - 3 වන සර්ගයේ (15,16 පද්‍ය) 10 වන සර්ගයේ (23,25 පද්‍ය)<br>- ගුත්තිල කාව්‍යය - (116,118 පද්‍ය) | ● ජනකතාවේ අන්තර්ගත මානව අත්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● ජනකතාවෙන් මතු වන ජීවන ආදර්ශ පැහැදිලි කරයි.<br>● සාහිත්‍ය නිර්මාණවලට පදනම් වන මානව අත්දැකීම් හඳුනාගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.<br>● විවිධ ජනකතා එක් රැස් කිරීමට යොමු වෙයි. | 04 |
| | 11.2 සාහිත්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙයි. | ● ජන කවි<br>- "පච් කළ ගොනෝ ඇදපන් හපුතල් යනවා" කවි පෙළ - සිංහල ජනකවි සංග්‍රහය (අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව) | ● ජනකවි හා එහි පසුබිම හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>● ජනකවි සාහිත්‍යාංගයක් වශයෙන් හඳුනාගෙන අගය කරයි.<br>● පද්‍ය පන්තිය සඳහා පාදක කවියාගේ අත්දැකීම් පැහැදිලි කරයි.<br>● ජනකවියෙන් පිළිබිඹු වන සංස්කෘතිය පැහැදිලි කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 12.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි. | 12.1 පද්‍ය නිර්මාණය කරයි. | • සරල පද්‍ය නිර්මාණය කිරීම | • පද්‍ය නිර්මාණය සඳහා සුදුසු තේමා හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>• පද්‍ය නිර්මාණය සඳහා සුදුසු කාව්‍යාලංකාර භාවිත කරයි.<br>• භාෂාව නිර්මාණාත්මක ලෙස භාවිත කිරීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.<br>• රසවත් කාව්‍ය නිර්මාණය කරයි. | 04 |
| | 12.2 නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි. | • නිර්මාණාත්මක ප්‍රබන්ධ රචනය | • ප්‍රබන්ධකරණය සඳහා සුදුසු අවස්ථා හා සිද්ධි හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>• රසවත් ව අදහස් ප්‍රකාශ කිරීමේ ශක්තිය ප්‍රදර්ශනය කරයි.<br>• උචිත චරිත, අවස්ථා හා සිද්ධි තර්කානුකූල ව ඉදිරිපත් කරයි.<br>• ප්‍රබන්ධ නිර්මාණය කරයි. | 04 |
| | 12.3 නාට්‍ය පිටපත් රචනයේ යෙදෙයි. | • දෙබස් රචනය | • නාට්‍ය දෙබසකට සුදුසු සිද්ධියක් තෝරාගෙන ඉදිරිපත් කරයි.<br>• දෙබස් රචනයේ මූලික ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිර්මාණාත්මක ව දෙබස් රචනා කරයි.<br>• දෙබස් රචනයේදි නාට්‍යෝචිත භාෂාව යොදා ගනියි. | 04 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

නිපුණතාව : 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

නිපුණතා මට්ටම : 1.1 සාහිත්‍ය නිර්මාණයකට සවන් දී ප්‍රතිචාර දක්වයි.

කාලච්ඡේද : 04යි.

ඉගෙනුම් පල :

- සවන් දී අදහස් ඉදිරිපත් කරයි.
- සවන් දී මතකයේ රඳවාගත් කරුණු ප්‍රකාශ කරයි.
- සවන් දී අවබෝධයෙන් යුතු ව පිළිතුරු සපයයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- සවන් දී කරුණු අවබෝධ කර ගැනීමේ වැදගත්කම ශිෂ්‍යයන්ට පැහැදිලි කරන්න.
- පෙළ පොතේ ඇතුළත් "නරි නයිදේ රැවටිච්චී" කතන්දරය සුදුසු ක්‍රමවේදයකින් ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- කතාවේ හරය මතකයෙන් ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- කතාවේ රසවත් අවස්ථා පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.

ගුණාත්මක යෙදවුම් :

- වටු කිරිල්ලී - ඒ. පී. ගුණරත්න
- ආසියාවේ ජනකතා - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- සිනා සෙමු අපි සැවොම - යුනෙස්කෝ ජාතික මණ්ඩලය

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ජනකතාවට සවන් දී එහි ඇති සිද්ධි මතකයෙන් කියයි.
- ජනකතාවෙන් ඉදිරිපත් කෙරෙන ආදර්ශ අගය කරයි.
- ජනකතාවේ රසවත් සිද්ධි හා අවස්ථා ඉදිරිපත් කරයි.
- කතාව මතකයෙන් කියයි.

නිපුණතාව : 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

නිපුණතා මට්ටම : 1.2 සවන් දී ප්‍රතිචාර දැක්වීමේ දී ආචාරශීලී බව හා සංයමය ප්‍රදර්ශනය කරයි.

කාලච්ඡේද : 04යි.

ඉගෙනුම් පල :

- පුද්ගල විවිධත්වය අනුව භාෂා ස්වරූපය වෙනස් වන බව ප්‍රකාශ කරයි.
- සමාජ පරිසරය අනුව භාෂා ස්වරූපයේ වෙනස්කම් පැහැදිලි කරයි.
- පුද්ගල විවිධත්වය හා සමාජ පරිසරය අනුව ආචාරශීලී ව හා සංයමයෙන් යුතු ව භාෂාව හසුරුවයි.

පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- පූජ්‍ය පක්ෂය, දෙමව්පියන්, ඥාතීන්, මිතුරන් සමග කතාබහේ දී භාෂා භාවිතයේ විවිධතා ඇති බව පැහැදිලි කරන්න.
- පූජ්‍ය පක්ෂය හා විවිධ පුද්ගලයන් සමග කතාබහේ දී තරාතිරම අනුව යොදා ගත යුතු වාක් කෝෂයේ විවිධතා ඇති බව ශිෂ්‍යයන්ට පෙන්වා දෙන්න.
- විවිධ පුද්ගලයන් අතර සිදු වන කතාබහ භූමිකා රංගනයක් මගින් ඉදිරිපත් කිරීම සඳහා ශිෂ්‍යයන් යොමු කරන්න.

මූලික වදන් හා සංකල්ප :

- භූමිකා රංගනය - කිසියම් සිද්ධියක්, අවස්ථාවක් අනුකරණය මගින් ඉදිරිපත් කිරීම

ගුණාත්මක යෙදවුම් :

- ජසයා හා ලෙංචිනා නාට්‍යය
- භාෂාව හා සමාජය - කේ. එන්. ඕ. ධර්මදාස

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- උචිත වචන භාවිත කරමින් සන්නිවේදනයේ නිරත වෙයි.
- පුද්ගල තරාතිරම අනුව කතාබහේ යෙදිය යුතු බව පිළිගනියි.
- පුද්ගල තරාතිරම අනුව ප්‍රතිචාර දක්වයි.
- පුද්ගල තරාතිරම පිළිබඳ ව සැලකිලිමත් වෙමින් කතා බහේ යෙදෙයි.
- කතා බහේ යෙදෙමින් පුද්ගල සම්බන්ධතා ගොඩ නගා නගියි.

නිපුණතාව : 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

නිපුණතා මට්ටම : 1.3 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රස විඳියි.

කාලච්ඡේද : 04යි.

ඉගෙනුම් පල :

- පද්‍ය පන්තියට අවධානයෙන් සවන් දී අදහස් ඉදිරිපත් කරයි.
- පද්‍ය පන්තියේ තේමාව හඳුනා ගෙන පැහැදිලි කරයි.
- වෙනත් පද්‍ය නිර්මාණ රස විඳීමට පෙලඹෙයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- උචිත ක්‍රමවේදයක් භාවිත කරමින් නිර්දිෂ්ට පද්‍ය නිර්මාණයට සවන් දීමට අවස්ථාව ලබා දෙන්න.
- සවන් දුන් පද්‍ය නිර්මාණ තාලානුරූප ව ගායනා කිරීමට යොමු කරන්න.
- පද්‍ය පන්තියේ තේමාව සහ අන්තර්ගතය පිළිබඳ ශිෂ්‍යයන් සමඟ සාකච්ඡාවක නිරත වන්න.
- සවන් දුන් පද්‍ය නිර්මාණ රසාස්වාදයට යොමු කරන්න.
- පද්‍ය නිර්මාණය පිළිබඳ තම අදහස් ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- මහින්ද ප්‍රබන්ධ - සුනිල් ආරියරත්න
- කුමර ගී - කුමාරතුංග මුනිදාස
- සරු පොළවක් අපට ඇතේ - මහගම සේකර

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- පද්‍ය නිර්මාණයට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.
- පද්‍ය පන්තියේ අන්තර්ගතය අගය කරයි.
- පද්‍යවලට සවන් දී රසාස්වාදයේ යෙදෙයි.
- වෙනත් පද්‍ය නිර්මාණ රස විඳීමට යොමු වෙයි.

| | | | |
|---|---|---|---|
| නිපුණතාව | : | 1.0 | සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි. |
| නිපුණතා මට්ටම | : | 1.4 | සාවධාන ව සවන් දී තොරතුරු රැස් කරයි. |
| කාලච්ඡේද | : | 05යි. | |

ඉගෙනුම් පල :

- අවධානයෙන් යුතු ව සවන් දී තොරතුරු රැස් කරයි.
- සවන් දී මතකයේ රඳවාගත් තොරතුරු ප්‍රකාශ කරයි.
- වැදගත් තොරතුරු සටහන් කර ගනියි.
- රැස් කරගත් තොරතුරු අවස්ථෝචිත ව යොදා ගනියි.

පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- සජීවී සාකච්ඡාවකට සවන් දීමට හැකි වන්නේ එක අවස්ථාවක් බැවින් එහි වැදගත්කම පෙන්වා දෙන්න.
- ගුවන්විදුලි වැඩසටහනකට සවන් දීමට සලස්වන්න.
- සවන් දෙන වැඩසටහනේ විශේෂ තොරතුරු, කරුණු සටහන් කර ගැනීමට සලස්වන්න.
- වෙනත් මෙවැනි වැඩසටහන්වලට සවන් දීමට යොමු කරවන්න.
- සවන් දෙන වැඩසටහන්වල විශේෂ තොරතුරු සටහන් කර ගැනීමට හුරු කරවන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- සිංහල වෙහෙර විහාර - ජේ.බී. දිසානායක
- සිංහල සිරිත් විරිත් - ජේ.බී. දිසානායක
- තුන්පත් රටා - ජේ.බී. දිසානායක

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සවන් දී මතකයේ රඳවා ගත් කරුණු ඉදිරිපත් කරයි.
- සවන් දී තොරතුරු ඉදිරිපත් කිරීමේ හැකියාව අගය කරයි.
- සටහන් කරගත් සුවිශේෂ තොරතුරු ඉදිරිපත් කරයි.
- සවන් දීමෙන් ග්‍රහණය කරගත් තොරතුරු අවස්ථානුකූල ව භාවිත කරයි.

නිපුණතාව : 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

නිපුණතා මට්ටම : 1.6 නිරවුල් හා නිවැරදි ලෙස බස හසුරුවමින් හඬ පාලනයෙන් යුතු ව කතා කරයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- සබකෝලයෙන් තොර ව කතා කරයි.
- අන්‍යයන්ගේ අවධානය දිනා ගනිමින් කතා කරයි.
- නිරවුල් ව හා පැහැදිලි ව තම අදහස් ප්‍රකාශ කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- මාතෘකානුකූල කතාවක දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ සාකච්ඡාවක නිරත වන්න.
- මාතෘකානුකූල කතාවකට (හඬපටයක් යොදා ගෙන) සවන් දීමට අවස්ථාව සලස්වන්න.
- මාතෘකානුකූල කතාවක ප්‍රධාන ලක්ෂණ ඉස්මතු කර දක්වන්න.
- එම ලක්ෂණ අනුව මාතෘකානුකූල කතාවක් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- ශිෂ්‍යයන්ගේ මට්ටමට ගැළපෙන මාතෘකා කිහිපයක් ලබා දෙන්න.

මූලික වදන් හා සංකල්ප

- මාතෘකානුකූල කතා - දෙන ලද මාතෘකාවකට අනුව කල් ඇති ව සූදානම් වී නිශ්චිත කතාවක් කිරීම.

ගුණාත්මක යෙදවුම් :

- වාදීභසිංහයෝ - සංයුක්ත තැටිය (ගුවන් විදුලි සංස්ථාව)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- මාතෘකානුකූල ව කතා කරයි.
- අර්ථාන්විත ව කරුණු ඉදිරිපත් කරමින් කතා කරයි.
- අන් අයගේ අවධානය ගනිමින් කතා කිරීමේ හැකියාව අගය කරයි.
- උචිත ලෙස භාෂාව හසුරුවමින් කතා කරයි.

නිපුණතාව : 2.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

නිපුණතා මට්ටම : 2.1 නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- නිවැරදි හා පැහැදිලි උච්චාරණයෙන් යුතු ව කියවයි.
- නිසි හඬපාලනයෙන් යුතු ව කියවයි.
- විරාම ලක්ෂණ කෙරෙහි සැලකිලිමත් වෙමින් කියවයි.
- අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ශබ්ද නගා කියවීමේ දී සැලකිලිමත් විය යුතු උච්චාරණය, හඬ පාලනය, විරාම ලකුණු කෙරෙහි සැලකිලිමත් වීම, අර්ථාවබෝධය යන කරුණු පිළිබඳ ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න.
- පෙළ පොතේ ඇතුළත් අලි උවදුර පාඩමෙන් කොටසක් සුදුසු ක්‍රමවේදයක් මගින් ආදර්ශනය කරන්න.
- සියලු ම ශිෂ්‍යයන්ට කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- පෙළ පොතේ ඇතුළත් සකස්කඩ කොටස ද කියවීමට යොමු කරන්න.

මූලික වදන් හා සංකල්ප

- නිවැරදි උච්චාරණය - අක්ෂර හා විරාම ලක්ෂණ පිළිබඳ සැලකිලිමත් වෙමින් හැඟීම් දනවන පරිදි උච්චාරණය කිරීම.
- හඬ පාලනය - අර්ථය ඉස්මතු වන පරිදි හඬ උස් පහත් කරමින් කියවීම.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- සකස්කඩ කෘතිය
- කියවන නුවණ 6 වන ශ්‍රේණිය - කුමාරතුංග මුනිදාස
- හීන් සැරය - කුමාරතුංග මුනිදාස

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- නිවැරදි උච්චාරණ සහිත ව හඬ පාලනයෙන් යුතු ව කියවයි.
- විරාම ලක්ෂණ කෙරෙහි සැලකිලිමත් වෙමින් කියවයි.
- ශිල්පීය ප්‍රයෝග කෙරෙහි අවධානය යොමු කරමින් කියවයි.
- නිවැරදි හා පැහැදිලි උච්චාරණයෙන් යුතු ව කියවීම අගය කරයි.

නිපුණතාව : 2.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

නිපුණතා මට්ටම : 2.2 විවිධ ශෛලියෙන් රචිත පොත පත කියවයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- විවිධ ශෛලි හඳුනා ගෙන කියවයි.
- උචිත ශෛලියකට අනුගත ව කියවයි.
- විවිධ ශෛලිවලට අනුව ලියවුණු පොතපත රස මතුවන අයුරින් කියවයි.
- විවිධ ශෛලිවලට අනුව කියවීමෙන් රස ජනනය වන බව පිළිගනියි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- විවිධ ශෛලිවලට අනුව ලියන ලද පොත පත කියවීමට අවස්ථාව ලබාදෙන්න.
- රචිත ශෛලිය අනුව කියවීමේ විවිධතා ඇති බව පැහැදිලි කරන්න.
- ශ්‍රැති ගෝචර ශෛලියට අනුව කියවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ ව ශිෂ්‍ය අවධානය යොමු කරවන්න.
- කියවීමේ විවිධ ශෛලීන් නිදර්ශනාත්මක ව හඳුන්වා දෙන්න.
- විවිධ ශෛලින්ට අනුව කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

මූලික වදන් හා සංකල්ප :

- ශෛලි - ශෛලි නම් ප්‍රකාශන විලාසයයි. ශෛලිය කථනයට මෙන් ම ලේඛනයට ද අදාළ වේ. කථකයා හෝ ලේඛකයා හෝ විසින් භාවිත කරනු ලබන වාංමාලාව වාගාලංකරණ ආදිය ශෛලියට අයත් වේ.
- ශ්‍රැති ගෝචර - අසන්නාට ප්‍රිය උපදවන අයුරින්
- රස ජනනය - ශබ්ද රසය, අර්ථ රසය, සංකල්ප රූප ආදි රස ඉපදවීම

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- නලපාන ජාතකය
- හිම කුමාරි - සෝමලතා සුබසිංහ
- ඉන්දුමතියගේ ස්වයංවරය / සැබෑ දේව පූජාව - කුමාරතුංග මුනිදාස (කියවන නුවණ)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- උචිත ශෛලි අනුගමනය කරමින් කියවයි.
- විවිධ ශෛලිවලට අනුව කියවීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- විවිධ ශෛලිවලින් කියවීමේ හැකියාව අගය කරයි.
- රසවින්දනය සඳහා විවිධ ශෛලිවලින් කියවයි.

නිපුණතාව : 2.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

නිපුණතා මට්ටම : 2.3 නිශ්ශබ්ද ව කියවා අවබෝධ කරගත් කරුණු ඉදිරිපත් කරයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- පොතපත කියවා තොරතුරු රැස් කරයි.
- අර්ථාවබෝධයෙන් යුතු ව කියවා පාරිභාෂික වචන පැහැදිලි කරයි.
- කියවීමෙන් ග්‍රහණය කරගත් තොරතුරු ඉදිරිපත් කරයි.
- විවිධ පොත පත කියවීමේ පුරුදු අගය කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- නිශ්ශබ්ද ව කියවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු සාකච්ඡා කරන්න.
- සාකච්ඡා කළ කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් ඇවිදින කොළයා පාඩම නිශ්ශබ්ද ව කියවීමට සිසුන් යොමු කරන්න.
- කේවල ක්‍රියාකාරමක් ලෙස සියලු ම සිසුන්ට කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- පාඩමෙහි අන්තර්ගතය අනුපිළිවෙළින් ගොඩනැගෙන සේ ප්‍රශ්න නගමින් අවබෝධය පරීක්ෂා කරන්න.

මූලික වදන් හා සංකල්ප :

- පාරිභාෂික වචන - අදාළ විෂයට පමණක් සීමා වූ වචන

ගුණාත්මක යෙදවුම් :

- විද්‍යා විනෝද කතා - මාර්ටින් වික්‍රමසිංහ

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- නිශ්ශබ්ද ව කියවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ප්‍රකාශ කරයි.
- නිශ්ශබ්ද ව කියවා කරුණු මතකයේ රඳවා ගැනීම අගය කරයි.
- නිශ්ශබ්ද ව කියවීමෙන් ග්‍රහණය කර ගත් කරුණු ප්‍රකාශ කරයි.
- විවිධ පොත පත කියවීමට යොමු වෙයි.

නිපුණතාව : 3.0 සිංහල අක්ෂරමාලාව හඳුනාගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි.

නිපුණතා මට්ටම : 3.1 සිංහල අක්ෂරමාලාව හඳුනාගෙන විවිධ ප්‍රභේද යටතේ වර්ග කරයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- සිංහල අක්ෂරමාලාව නිවැරදි ව අනුපිළිවෙළින් ලියා දක්වයි.
- අකුරු නිවැරදි ප්‍රමාණයෙන් හා නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි.
- පිල්ලම් හඳුනාගෙන නිවැරදි ව භාවිත කරයි.

පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- සිංහල අක්ෂරමාලාව ප්‍රදර්ශනය කරමින් ශිෂ්‍යයාට අක්ෂර මාලාව හඳුන්වා දෙන්න.
- සිංහල අක්ෂරමාලාව අනුපිළිවෙළට මතකයෙන් ලිවීමට අවස්ථාව ලබා දෙන්න.
- පිල්ලම් පිළිබඳ ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න.
- පිල්ලම් නිවැරදි ව භාවිත කිරීමට යොමු කරන්න.

මූලික වදන් හා සංකල්ප :

- පිල්ලම් - ව්‍යඤ්ජනාක්ෂරයකට ස්වරයක් එකතු වන විට එම ස්වරය නියෝජනය කිරීම සඳහා ව්‍යඤ්ජන අක්ෂරයට යොදන සංකේත.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- අක්ෂරමාලාව සහ පිල්ලම් ලියූ පුවරු
- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය
- සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්ලිව්.එස්. කරුණාතිලක

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සිංහල අක්ෂරමාලාව අනුපිළිවෙළින් මතකයෙන් ලියා දක්වයි.
- අකුරු නිවැරදි ව ලියයි.
- පිල්ලම් නිවැරදි ව හඳුනාගෙන පැහැදිලි කරයි.
- පිල්ලම් නිවැරදි ව යොදමින් ලේඛනයේ යෙදෙයි.

නිපුණතාව : 3.0 සිංහල අක්‍ෂරමාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි.

නිපුණතා මට්ටම : 3.3 නිවැරදි අක්‍ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි.

කාලච්ඡේද : 09යි.

ඉගෙනුම් පල :

- න, ණ, ල, ළ අක්ෂර වචනවල නිවැරදි ව යොදයි.
- අල්පප්‍රාණ හා මහාප්‍රාණ අක්ෂර නිවැරදි ව යොදයි.
- සඤ්ඤක අක්ෂර අර්ථවත් ලෙස භාවිත කරයි.
- අක්‍ෂර වින්‍යාසය පිළිබඳ දැනුම ලේඛනයේ දී ඉවහල් කර ගනියි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ලේඛනයේ දී අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
- න, ණ, ල, ළ, නිවැරදි ව යෙදීම පිළිබඳ ක්‍රියාකාරකමක් ඇසුරෙන් පැහැදිලි කරන්න.
- අල්පප්‍රාණ, මහාප්‍රාණ අක්ෂර පිළිබඳ අභ්‍යාසයක යොදවන්න.
- සඤ්ඤක අක්ෂර සහිත වචනවලට සවන් දී ලිවීමේ අභ්‍යාසයක නිරත කරවන්න.
- ශිෂ්‍ය ඉදිරිපත් කිරීම්වලට අවස්ථාව සලසා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- සුදුසු ක්‍රමවේදයක් මගින් අක්ෂර වින්‍යාසය පිළිබඳ ශිෂ්‍යයන්ගේ දැනුම පරීක්ෂා කරන්න.

මූලික වදන් හා සංකල්ප :

- අක්ෂර වින්‍යාසය - වචනයකට යෙදෙන අකුරු පිළිවෙළ
- අල්පප්‍රාණ අක්ෂර - අඩු හඬකින් උච්චාරණය වන භාෂාත්මක ශබ්ද සංකේත
- මහාප්‍රාණ අක්ෂර - වැඩි හඬකින් උච්චාරණය වන භාෂාත්මක ශබ්ද සංකේත
- සඤ්ඤක අක්ෂර - නාසය ද උපයෝගි කර ගනිමින් උච්චාරණය වන භාෂාත්මක ශබ්ද සංකේත
- ප්‍රතිපෝෂණය - අවබෝධ නොවූ විෂය කරුණු අවබෝධ කර දීම සඳහා පැහැදිලි කිරීම/ක්‍රියාකාරකම්වල යෙදවීම.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය
- සිංහලයේ අක්ෂර වින්‍යාසය අත්පොත - ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය
- සිංහල අක්ෂර වින්‍යාසය අකාරාදිය - සඳගෝමී කෝපරහේවා

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලිවීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- ලේඛනවල අක්ෂර වින්‍යාසය නිවැරදි කිරීමේ හැකියාව අගය කරයි.
- න, ණ, ල, ළ භේදය ගැන සැලකිලිමත් වෙමින් වචන ලියයි.
- අල්පප්‍රාණ, මහාප්‍රාණ අක්ෂර වචනවල නිවැරදි ව යොදයි.
- සඤ්ඤක අක්ෂර සහිත වචන අර්ථවත් ව ලියයි.

නිපුණතාව : 4.0 ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් නිවැරදි ව ලේඛන කාර්යයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 4.1 විරාම ලකුණු නිවැරදි ව භාවිත කරමින් ලියයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- විරාම ලකුණු නිවැරදි ව හඳුනා ගෙන නම් කරයි.
- ලේඛනයේ දී විරාම ලකුණු අර්ථවත් ව භාවිත කරයි.
- විරාම ලකුණු නිවැරදි ව යෙදීම අගය කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- විරාම ලකුණු නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- නිවැරදි ලෙස විරාම ලක්ෂණ යෙදූ ලේඛනයක් පරීක්ෂා කිරීමට ශිෂ්‍යයන්ට ලබාදෙන්න.
- විරාම ලකුණු නිවැරදි ව යෙදෙන අවස්ථා හඳුනාගෙන ඒවා නිවැරදි ව ලේඛනවල යෙදීමට යොමු කරන්න.
- ලේඛනවල නිරවද්‍යතාව පරීක්ෂා කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

මූලික වදන් හා සංකල්ප :

- විරාම ලකුණු - ලේඛනයක විරාමය, විශ්‍රාමය දැක්වීම සඳහා යොදන සංකේත

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය
- සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය - පී. තේනබදු

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:

- ලේඛනයේ දී විරාම ලකුණු නිවැරදි ව හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- විරාම ලකුණු නිවැරදි ව භාවිත කිරීම අගය කරයි.
- විරාම ලකුණු නිවැරදි ව යොදමින් ලේඛනයේ ව්‍යක්ත බව පළ කරයි.

නිපුණතාව : 4.0 ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් නිවැරදි ව ලේඛන කාර්යයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 4.2 පද බෙදීමේ රීති අනුගමනය කරමින් ලියයි.

කාලච්ඡේද : 04 යි.

ඉගෙනුම් පල :

- නාම පද, ක්‍රියා පද හා නිපාත පද හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- පද බෙදීමේ දී නාම, ක්‍රියා, නිපාත වෙන් කොට ලියයි.
- ලේඛනයේ දී නිවැරදි ව පද බෙදා ලිවිය යුතු බව පිළිගනියි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- නිවැරදි ව පද බෙදා ලිවීමේ වැදගත්කම පිළිබඳ ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න.
- නාම පද, ක්‍රියා පද හා නිපාත පද ස්වාධීන පද වර්ග තුනක් බව පෙන්වා දෙන්න.
- ඒවා වෙන් වෙන් ව ලිවිය යුතු බව පැහැදිලි කරන්න.
- නිවැරදි ව පද බෙදා ඇති ඡේදයක් ශිෂ්‍යයන් ට ලබා දී එය අධ්‍යයනය කිරීමට යොමු කරන්න.
- නාම, ක්‍රියා, නිපාත යන පද වෙන් වෙන් ව ලිවීම තහවුරු කිරීමට සුදුසු ක්‍රියාකාරකම් ලබා දෙන්න.

ගුණාත්මක යෙදවුම් :

- නිවැරදි ව පද බෙදා ලියා ඇති ඡේද කිහිපයක්
- සිංහලයේ වචන වෙන් කිරීම (අත් පොත) - ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය
- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:

- නාම පද, ක්‍රියා පද, නිපාත පද හඳුනා ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- පද බෙදා ලිවීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- නාම, ක්‍රියා, නිපාත වෙන් කරමින් නිවැරදි ව පද බෙදා ලියයි.

නිපුණතාව : 5.0 භාෂාමය කාර්යයේ දී වාක් කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 5.1 වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි.

කාලච්ඡේද : 06යි.

ඉගෙනුම් පල :

- සමානාර්ථවත් පද, විරුද්ධාර්ථවත් පද හා විශේෂණ පද හඳුනාගෙන නම් කරයි.
- ලේඛනයේ දී සමානාර්ථවත් පද විරුද්ධාර්ථවත් සඳහා විශේෂණ පද නිවැරදි ව ලියයි.
- පුළුල් කර ගත් වාක්කෝෂීය හැකියාව අගය කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- පෙළ පොතේ ඇතුළත් සමානාර්ථවත් පද, විරුද්ධාර්ථවත් පද හා විශේෂණ පද හඳුනා ගැනීමට සලස්වන්න.
- එම පදවල අර්ථය පැහැදිලි කර ගැනීමට උදව් කරන්න.
- එම පදවල අර්ථය ප්‍රකාශ වන සේ වාක්‍ය නිර්මාණය කිරීමට යොමු කරන්න.
- සමානාර්ථ පද, විරුද්ධාර්ථ පද හා විශේෂණ පද ඇතුළත් වගුවක් පිළියෙල කරවන්න.

මූලික වදන් හා සංකල්ප :

- වාක් කෝෂය - වචන ගොනුව
- සමානාර්ථවත් පද - වචනයක අර්ථයට සමාන අර්ථය දෙන වෙනත් පද
- විරුද්ධාර්ථවත් පද - වචනයක අර්ථයට පටහැනි අර්ථය දෙන පද
- විශේෂණ පද - වචනයක අර්ථය වඩාත් විශේෂ කර දැක්වීම සඳහා යොදන පද

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා
- සිංහල විරුද්ධාර්ථ පද කෝෂය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක

අඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:

- සමානාර්ථවත් පද, විරුද්ධාර්ථවත් පද හා විශේෂණ පද හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- සමානාර්ථවත් පද හා විරුද්ධාර්ථවත් පද නිවැරදි ව වාක්‍යවල යොදයි.
- විශේෂණ පද යොදා අර්ථවත් වාක්‍ය නිර්මාණය කරයි.

නිපුණතාව : 5.0 භාෂාමය කාර්යයේ දී වාක් කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 5.2 සාම්ප්‍රදායික යෙදුම් භාෂාමය කාර්යයේ දී උචිත පරිදි භාවිත කරයි.

කාලච්ඡේද : 04යි.

ඉගෙනුම් පල :

- ප්‍රස්තාව පිරුළු හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- ප්‍රස්තාව පිරුළු සම්බන්ධ කතා ඉදිරිපත් කරයි.
- ලේඛනයේ දී මෙන් ම කථනයේ දී ද උචිත පරිදි ප්‍රස්තාව පිරුළු භාවිත කරයි.

පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ප්‍රස්තාව පිරුළු පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක නිරත වන්න.
- ප්‍රස්තාව පිරුළු යොදා ගෙන රසවත් හා ව්‍යක්ත ලෙස අදහස් ප්‍රකාශ කළ හැකි බව පෙන්වා දෙන්න.
- ප්‍රස්තාව පිරුළු හා සම්බන්ධ විවිධ කතා ශිෂ්‍යයන්ගෙන් මතුකර ගන්න.
- හඳුනාගත් ප්‍රස්තාව පිරුළු භාෂා කාර්යයේ දී නිර්මාණාත්මක ව යොදා ගැනීමට යොමු කරන්න.
- ප්‍රස්තාව පිරුළු සහිත ලේඛනයක් සකස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරවන්න.

මූලික වදන් හා සංකල්ප :

- සාම්ප්‍රදායික යෙදුම් - දීර්ඝ කාලයක සිට භාෂාවේ භාවිත වෙමින් සුවිශේෂ අදහස් ප්‍රකාශ කිරීමට සමත් යෙදුම්
- ප්‍රස්තාව පිරුළු - කිසියම් අවස්ථාවක් හෝ සිද්ධියක් පදනම් කර ගෙන ගොඩනැගුණු කියමන්

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- සිංහල පිරුළු සාහිත්‍යය - අලවත්තාගොඩ ප්‍රේමදාස
- පිරුළු මිණි - ටී. එස්. ධර්මබන්දු

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:

- ප්‍රස්තාව පිරුළු හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ප්‍රස්තාව පිරුළු භාවිත කරමින් රසවත් ලෙස අදහස් ප්‍රකාශ කරයි.
- ප්‍රස්තාව පිරුළු සහිත ලේඛනයක් සකස් කරයි.
- ප්‍රස්තාව පිරුළු සම්බන්ධ කතාන්තර එක් රැස් කරයි.

නිපුණතාව : 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 6.1 නාම පද සහ එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛනයේ යෙදෙයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- නාම පදවල වචන භේදය, පුරුෂ භේදය, ලිංග භේදය හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- නාම පදවල උක්ත අනුක්ත භේදය හඳුනාගෙන විස්තර කරයි.
- වාක්‍ය නිර්මාණයේ දී උක්ත අනුක්ත නාම පද නිවැරදිව යොදයි.
- ප්‍රායෝගික භාෂා කාර්යයේ දී නාම පද පිළිබඳ දැනුම භාවිත කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- සුදුසු ක්‍රියාකාරකම් ඇසුරෙන් නාම පදයක වචන භේදය, පුරුෂ භේදය, ලිංග භේදය හා උක්ත අනුක්ත භේදය හඳුන්වා දෙන්න.
- භාෂා භාවිතයේ දී නාම පදයක ඉහත දැක්වුණු ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කළ යුතු බව පෙන්වා දෙන්න.
- නාම පදවල වචන භේදය පුරුෂ භේදය, ලිංග භේදය පැහැදිලි වන සේ වාක්‍ය නිර්මාණයට යොමු කරන්න.
- උක්ත අනුක්ත භේදය පිළිබඳ ව අවධානය යොමු කරමින් වාක්‍ය නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

මූලික වදන් හා සංකල්ප :

- වචන භේදය - නාම පදයක හෝ ක්‍රියා පදයක හෝ ඒක වචන බහු වචන භේදය
- පුරුෂ භේදය - විස්තර කරන සිද්ධියක් හා සම්බන්ධ කථකයා, ආමන්ත්‍රණය ලබන්නවුන් හා අන්‍යයන් අතර සම්බන්ධය පෙන්නුම් කරන නාම පදයේ ප්‍රභේදයකි.
- ලිංග භේදය - ස්ත්‍රී, පුරුෂ නපුංසක වශයෙන් නාම හෝ ක්‍රියා හෝ පදවල දක්නට ලැබෙන ප්‍රභේදයකි.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය
- සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක
- නාම පද - ජේ. බී. දිසානායක

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:

- නාම පදයක වචන භේදය, පුරුෂ භේදය, ලිංග භේදය යන ලක්ෂණ හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- නාම පදවල වචන භේදය, පුරුෂ භේදය හා ලිංග භේදය හඳුනාගෙන වාක්‍ය නිර්මාණය කරයි.
- උක්ත අනුක්ත භේදය පිළිබඳ අවධානයෙන් යුක්ත ව වාක්‍ය නිර්මාණය කරයි.
- නාම පදවල වචන, පුරුෂ හා ලිංග භේදය නිවැරදි ව භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

නිපුණතාව : 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 6.2 ක්‍රියා පද හා එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි.

කාලච්ඡේද : 06යි.

ඉගෙනුම් පල :

- වචන, පුරුෂ, ලිංග හා කාල වශයෙන් ක්‍රියා පද වර්ග කරයි.
- ක්‍රියා පදවල වචන භේදය, පුරුෂ භේදය, ලිංග භේදය, කාල භේදය හඳුනාගෙන ලියයි.
- ප්‍රායෝගික භාෂා කාර්යයේ දී ක්‍රියා පද පිළිබඳ දැනුම නිවැරදි ව භාවිත කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ක්‍රියාකාරකම් ඇසුරින් ක්‍රියා පදයක වචන භේදය, පුරුෂ භේදය, ලිංග හා කාල භේදය හඳුන්වා දෙන්න.
- ක්‍රියා පදවල වචන, පුරුෂ, ලිංග හා කාල භේදය නිරූපණය වන වගුවක් සකස් කිරීමට මග පෙන්වන්න.
- හඳුනාගත් ක්‍රියා පද ප්‍රභේද ප්‍රායෝගික ව යොදා ගැනීමට යොමු කරවන්න.
- මේ සඳහා ක්‍රියා පද හා සම්බන්ධ පාඩම යොදා ගන්න.

මූලික වදන් හා සංකල්ප :

- කාල භේදය - ක්‍රියා පදයක අතීත හා අනතීත යන කාල භේදය

ගුණාත්මක යෙදවුම් :

- ක්‍රියා පදවල ව්‍යාකරණ ලක්ෂණ පැහැදිලි වන පරිදි සකසන ලද පුවරුවක්

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය
- සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක
- භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය - විමල් ජී. බලගල්ලේ
- ක්‍රියා පදවල ව්‍යාකරණ ලක්ෂණ පැහැදිලි වන පරිදි සකසන ලද පුවරුවක්

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ක්‍රියා පදවල වචන, පුරුෂ, ලිංග හා කාල ප්‍රභේද හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ක්‍රියා පදවල විවිධ ප්‍රභේද හඳුනා ගෙන ලියයි.
- වචන, පුරුෂ, ලිංග හා කාල භේදය අනුව ක්‍රියා පද වගු ගත කරයි.

නිපුණතාව : 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 6.5 සම්මත රීතිවලට අනුගත ව වාක්‍ය ලියයි.

කාලච්ඡේද : 08යි.

ඉගෙනුම් පල :

- නාම පදයේ හා ක්‍රියා පදයේ වචන භේදය, පුරුෂ භේදය, ලිංග භේදය හා කාල භේදය අනුව වාක්‍ය නිර්මාණය කරයි.
- නිවැරදි වාක්‍ය රීති භාවිතයේ වැදගත්කම අගය කරයි.
- උක්තය, කර්මය, ආඛ්‍යාතය කෙරෙහි අවධානයෙන් යුතු ව වාක්‍ය නිර්මාණය කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- නාම පද හා ක්‍රියා පද පිළිබඳ පෙර දැනුම අවදි කරන්න.
- නාම පදයේ හා ක්‍රියා පදයේ වචන භේදය, පුරුෂ භේදය, ලිංග භේදය, හා කාල භේදය අනුව වාක්‍ය ගොඩ නැගෙන ආකාරය නිදර්ශන ඇසුරෙන් පැහැදිලි කරන්න.
- සම්මත වාක්‍ය රීති කිහිපයක් හඳුන්වා දෙන්න.
- සම්මත රීතිවලට අනුගත ව වාක්‍ය ලිවීමට හුරු කරන්න.

ගුණාත්මක යෙදවුම් :

- සරල වාක්‍යයක ආකෘතිය දැක්වෙන පුවරු
- නාම පද හා ක්‍රියා පද ප්‍රභේද දැක්වෙන පුවරු / පත්‍රිකා / වගු

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- සිංහල භාෂාවේ ව්‍යාකරණ - ඩබ්ලිව්.එස්. කරුණාතිලක

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- වචන, පුරුෂ, ලිංග හා කාල භේදය සම්බන්ධ වාක්‍ය රීති හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- උක්තය හා ආඛ්‍යාතය අතර ඇති සම්බන්ධතාව හඳුනාගෙන පැහැදිලි කරයි.
- සම්මත රීතිවලට අනුව වාක්‍ය ලියයි.

| | | | |
|---|---|---|---|
| නිපුණතාව | : | 7.0 | භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි. |
| නිපුණතා මට්ටම | : | 7.1 | තොරතුරු සන්නිවේදනය සඳහා ලිපි ලියයි. |
| කාලච්ඡේද | : | 04යි. | |

ඉගෙනුම් පල :

- පෞද්ගලික ලිපියක ආකෘතිය හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- පෞද්ගලික ලිපියක ආකෘතිය අනුගමනය කරමින් ලිපි ලියයි.
- ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් ලිපි ලියයි.
- ලිපි ලිවීම පිළිබඳ නිවැරදි දැනුම භාවිත කරයි.

පාඩම් සැලසුම් කිරීමට උපදෙස් :

- පෞද්ගලික ලිපි ලිවීමේ අරමුණු පැහැදිලි කරන්න.
- පෞද්ගලික ලිපියක ආකෘතිය ශිෂ්‍යයන්ට හඳුන්වා දෙන්න. (පුවරුවක් හෝ ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් යොදා ගන්න)
- පෞද්ගලික ලිපියක අන්තර්ගතය ගැන ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- නියමිත ආකෘතිය අනුව පෞද්ගලික ලිපියක් ලිවීමට යොමු කරන්න.

මූලික වදන් හා සංකල්ප :

- ශිල්පීය ප්‍රයෝග - විරාම ලක්ෂණ, පද බෙදීම, ඡේද වෙන් කොට ලිවීම ආදිය

ගුණාත්මක යෙදවුම් :

- පෞද්ගලික ලිපියක ආකෘතියක්
- ආදර්ශ පෞද්ගලික ලිපි කිහිපයක්

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- පෞද්ගලික ලිපියක ආකෘතිය හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් ලිපි ලියයි.
- නිරවුල් ව අදහස් ගොනු කරමින් ලිපි ලියයි.
- තොරතුරු සන්නිවේදනය සඳහා පෞද්ගලික ලිපි ලියයි.

නිපුණතාව : 7.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 7.2 ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ලේඛන සකස් කරයි.

කාලච්ඡේද : 04යි.

ඉගෙනුම් පල :

- සුබ පැතුම් පතක මූලික ලක්ෂණ හඳුන්වයි.
- මූලික ලක්ෂණ භාවිත කරමින් සුබ පැතුම් පත් නිර්මාණය කරයි.
- සුබ පැතුම් පත් නිර්මාණයේ දී උචිත ශිල්පීය ප්‍රයෝග භාවිත කරයි.
- නිර්මාණාත්මක ලක්ෂණ ඉස්මතු කරමින් සුබ පැතුම් පත් නිර්මාණය කරයි.

පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- විවිධ වර්ගවල සුබ පැතුම් පත් කිහිපයක් ශිෂ්‍යයන්ට ලබා දී ඒවා පිරික්සීමට අවස්ථාව ලබා දෙන්න.
- සුබ පැතුම් පතක් සකස් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- සුබ පැතුම් පත් ඇසුරෙන් සුදුසු ආකෘති හඳුනාගැනීමට යොමු කරන්න.
- විවිධ සුබ පැතුම් පත් නිර්මාණය කිරීමට යොමු කරන්න.

ගුණාත්මක යෙදවුම් :

- මුද්‍රිත සුබ පැතුම් පත්
  (උපන් දින සුබ පැතුම් පත්, වෙසක් සුබ පැතුම් පත්, නත්තල් සුබ පැතුම් පත් ආදිය)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- විවිධ සුබ පැතුම් පත් හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- සුබ පැතුම් පතක මූලික ලක්ෂණ නම් කරයි.
- සුබ පැතුම් පත් නිර්මාණාත්මක ව ඉදිරිපත් කළ යුතු බව පිළිගනී.
- ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් සුබ පැතුම් පත් සකස් කරයි.
- විවිධ සුබ පැතුම් පත් නිර්මාණය කරයි.

නිපුණතාව : 8.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 8.1. කරුණු සංවිධානය කර ගනිමින් මාතෘකානුකූල ව රචනා ලියයි.

කාලච්ඡේද : 04යි.

ඉගෙනුම් පල :

- රචනා ලිවීම සඳහා සුදුසු මාතෘකා තෝරා ගනියි.
- මාතෘකාවට අනුව රචනාවට සුදුසු ආකෘතියක් ගොඩ නගයි.
- මාතෘකාවට අදාළ ව කරුණු සංවිධානය කරමින් රචනා ලියයි.
- රචනා ලිවීමේ දී භාෂා ව්‍යවහාරය උචිත පරිදි යොදා ගනියි.
- ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් රචනා ලියයි.

පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- රචනයක් ලිවීම සඳහා සුදුසු තේමාවක් හඳුනා ගැනීමට යොමු කරන්න.
- ඊට අනුකූල වන පරිදි මාතෘකාවක් සකස් කර ගන්න.
- රචනයක දළ සැකිල්ලක් (ආකෘතියක්) සකස් කර ගැනීමට යොමු කරන්න.
- මාතෘකාවට අදාළ ව කරුණු ගොනු කර ගැනීම සඳහා ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- රචනයක් ලිවීම සඳහා අවශ්‍ය මූලික කරුණු පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- භාෂා ව්‍යවහාරය හා නිර්මාණාත්මක කුසලතා භාවිත කරමින් රචනය ලිවීමට යොමු කරන්න.

ගුණාත්මක යෙදවුම් :

- ආදර්ශ රචනා කිහිපයක්
- රචනා මාතෘකාවලට අදාළ පුවත් පත් ලිපි

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- රචනා මාතෘකාවට අදාළ කරුණු රැස් කරයි.
- රචනා ලිවීමේ දී කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කළ යුතු බව පිළිගනියි.
- ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් රචනා ලියයි.
- රචනා ලිවීමේ දී භාෂා ප්‍රයෝග උචිත පරිදි භාවිත කරයි.

නිපුණතාව : 8.0 භාෂාව නිරවුල් ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 8.2 පාඨකයා ආකර්ෂණය වන පරිදි අදහස් ඉදිරිපත් කරමින් නිර්මාණාත්මක ව ලියයි.

කාලච්ඡේද : 4යි.

ඉගෙනුම් පල :

- බිත්ති පුවත් පත් හා සඟරා ලිපිවල විශේෂ ලක්ෂණ හඳුනාගෙන විස්තර කරයි.
- නිවැරදි ව හා නිරවුල් ව අදහස් ඉදිරිපත් කරමින් බිත්ති පුවත් පත් හා සඟරා ලිපි ලියයි.
- ආකර්ෂණීය ලෙස කරුණු ඉදිරිපත් කරමින් ලේඛනයේ යෙදෙයි.

පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- බිත්ති පුවත් පත් ලිපි හා සඟරා ලිපි සඳහා සුදුසු මාතෘකා සාකච්ඡා කරන්න.
- බිත්ති පුවත් පතක ආකෘතිය පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- සුදුසු මාතෘකා ශිෂ්‍යයන්ට බෙදා දෙන්න.
- ලිපි සඳහා ලැබෙන ඉඩ ප්‍රමාණය සලකා ලිපියක තිබිය යුතු වචන සංඛ්‍යාව සීමා කළ යුතු බව දක්වන්න.
- බිත්ති පුවත් පත හා සඟරාව සඳහා සංස්කාරක මණ්ඩලයක් පත්කර ගන්න.
- ශිෂ්‍යයන්ගේ නිර්මාණ ඇතුළත් බිත්ති පුවත් පතක් හා සඟරාවක් සකස් කිරීමට යොමු කරන්න.

ගුණාත්මක යෙදවුම් :

- බිත්ති පුවත් පතක ආකෘතියක්
- බිත්ති පුවත්පත් හා සඟරා ලිපි කිහිපයක්

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- බිත්ති පුවත් පත් ලිපියක විශේෂතා පැහැදිලි කරයි.
- නිර්මාණාත්මක ව බිත්ති පුවත් පත් හා සඟරා ලිපි ලියයි.
- පාඨකයාගේ සිත් ඇද ගන්නා අයුරින් පුවත් පත් හා සඟරා ලිපි ලිවිය යුතු බව පිළිගනියි.
- භාෂාව නිර්මාණාත්මක ව හැසිරවීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- පාඨකයාට දැනුම හා වින්දනය ලබා දෙන අයුරින් පුවත් පත් හා සඟරා ලිපි ලියයි.

| | | | |
|---|---|---|---|
| නිපුණතාව | : | 9.0 | සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩ නගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි. |
| නිපුණතා මට්ටම | : | 9.1 | සංස්කෘතික උරුමය හා හර පද්ධති පිළිබඳ අවබෝධය ලබා ගැනිම සඳහා ලිපි ලේඛන පරිශීලනය කරයි. |
| කාලච්ඡේද | : | 05යි. | |

ඉගෙනුම් පල :

- වැව හා බැඳුණු සංස්කෘතික තොරතුරු රැස් කරයි.
- වැව හා බැඳුණු සංස්කෘතික උරුමය සම්බන්ධ දැනුම අවස්ථානුකූලව යොදා ගනියි.
- වැව හා බැඳුණු සංස්කෘතිය අගය කරයි

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- වැව හා බැඳුණු සංස්කෘතික උරුමය ගැන ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- වැව හා බැඳුණු සංස්කෘතික ලක්ෂණ හඳුනාගෙන ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- සංස්කෘතික ලක්ෂණ ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම අවධාරණය කරන්න.
- වැව හා බැඳුණු සංස්කෘතිය පිළිබඳ තොරතුරු එක් රැස් කරමින් බිත්ති පුවත් පතට ලිපියක් ලිවීමට මග පෙන්වන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- වැව ආශ්‍රිත ඡායාරූප, රූප සටහන්, චිත්‍ර
- ශ්‍රී ලංකාවේ වාරි තාක්ෂණය/සංස්කෘතික උරුමය ගැන ලියවුණු ලිපි හා වෙනත් ලේඛන

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- වාරි තාක්ෂණය හා බැඳුණු සංස්කෘතික ලක්ෂණ ඉදිරිපත් කරයි.
- ශ්‍රී ලාංකික වාරි සංස්කෘතියට අදාළ ලක්ෂණ අගය කරයි.
- වාරි සංස්කෘතිය ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- වාරි තාක්ෂණය හා බැඳුණු සංස්කෘතික උරුමය රැක ගැනීමට යොමු වෙයි.

| | | | |
|---|---|---|---|
| නිපුණතාව | : | 9.0 | සංස්කෘතිය හා සාරධර්ම හඳුනාගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි. |
| නිපුණතා මට්ටම | : | 9.2 | පොත පත පරිශීලනයෙන් සාරධර්ම වර්ධනය කර ගනියි. |
| කාලච්ඡේද | : | 04යි. | |

ඉගෙනුම් පල :

- කවි පෙළ කියවා යහ පුරුදු යනු මොනවා දැයි විස්තර කරයි.
- යහපත් සිරිත් රැක ගැනීමේ වටිනාකම අගයමින් කතා කරයි.
- යහ සිරිත් අනුගමනය කරයි

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- කවි පෙළ ශ්‍රවණය කිරීමට සලස්වන්න.
- ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එහි ඇතුළත් සාරධර්ම මතු කරමින් ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක නිරත වන්න.
- සාරධර්ම රැක ගැනීමේ හා අනුගමනය කිරීමේ වැදගත්කම අවබෝධ කර දෙන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- සිරිත් මල්දම
- සුභාෂිතය

ඇගයීම් හා තක්සේරුකරණයට උපදෙස් :

- සාරධර්ම යනු මොනවාදැයි කවි පෙළ ඇසුරෙන් විස්තර කරයි.
- කවි පෙළ කියවීමෙන් හඳුනාගත් සාරධර්ම අගය කරයි.
- සාරධර්ම සුරැකීමේ අගය ගැන කතා කරයි.
- සාරධර්ම අනුගමනය කරමින් කටයුතු කරයි.

නිපුණතාව : 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

නිපුණතා මට්ටම : 9.3 දේශාභිමානී හැඟීම් දනවන සාහිත්‍ය නිර්මාණ ඇසුරු කරයි.

කාලච්ඡේද : 04යි.

ඉගෙනුම් පල :

- දේශාභිමානී ගීතයෙන් ප්‍රකාශ වන අදහස් සරල ව පැහැදිලි කරයි.
- ගීතයෙන් ගම්‍යවන දේශාභිමානී අදහස් අගය කරයි.
- ගීතයේ ඇතුළත් කාව්‍යෝපක්‍රම පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි.
- දේශාභිමානී සාහිත්‍ය නිර්මාණ රසාස්වාදය කරයි.

පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- දේශාභිමානී ගීතයට සවන්දීමට සලස්වන්න.
- ගීතයෙන් ප්‍රකාශ වන අදහස් පැහැදිලි කරන්න.
- දේශාභිමානය දැනවීම සඳහා කවියා යොදා ගෙන ඇති උපක්‍රම හඳුනාගැනීමට සලස්වන්න.
- දේශාභිමානී ගීත හඳුනාගෙන රසවිඳීමට යොමු කරන්න.
- දේශාභිමානී පද්‍ය නිර්මාණ එකතුවක් පිළියෙල කරවන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- දේශාභිමානී පද්‍ය නිර්මාණ අන්තර්ගත පද්‍ය කෘති - කුමාරතුංග මුනිදාස, මහින්ද ප්‍රබන්ධ - සුනිල් ආරියරත්න

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- නිර්මාණයෙන් මතු වන දේශාභිමානි හැඟීම් ඉදිරිපත් කරයි.
- ගීතයේ ගැබ් වූ අදහස් අගය කරයි.
- ගීතයෙන් දේශාභිමානී හැඟීම් මතු වන අවස්ථා විස්තර කරයි.
- දේශාභිමානී ගීත නිර්මාණ රස විඳියි.

නිපුණතාව : 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කර ගනියි.

නිපුණතා මට්ටම : 9.4 විවිධ ජන කොටස්වලට අයත් සිරිත් විරිත් හඳුනාගැනීම සඳහා කියවයි.

කාලච්ඡේද : 04යි.

ඉගෙනුම් පල :

- දේශීය ජන වර්ග හඳුනාගෙන නම් කරයි.
- වැදි ජනතාවගේ සංස්කෘතික ලක්ෂණ හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- විවිධ සංස්කෘතිවලට ගරු කිරීමට පෙලඹෙයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ශ්‍රී ලංකාවේ වෙසෙන විවිධ ජන වර්ග පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- එම ජන වර්ග අතරින් වැදි ජනතාව විශේෂ ජන වර්ගයක් ලෙස හඳුන්වා දෙන්න.
- වැදි ජනයාගේ ආරම්භය හා සම්බන්ධ ජනප්‍රවාද පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- වැදි ජනතාවගේ සිරිත් විරිත් පිළිබඳ සාකච්ඡා කරන්න.
- වැදි ජනතාවගේ වෙනත් ජීවන තොරතුරු ගවේෂණයට යොමු කරන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- වැද්දන්ගේ විකාශන ක්‍රමය - නන්දදේව විජේසේකර
- සිරිලක වැදි ජන පුරාණය - පී. බී. මීගස්කුඹුර
- දඹානේ වැදි බස - සුගතපාල ද සිල්වා

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ශ්‍රී ලංකාවේ වැදි ජනයා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- ඔවුන්ගේ යහ සිරිත් හඳුනාගෙන අගය කරයි.
- වැදි ජනයාගේ සංස්කෘතික ලක්ෂණ ප්‍රකාශ කරයි.
- ඔවුන්ගේ දිවි පෙවෙත පිළිබඳ වැඩිදුර තොරතුරු එක්රැස් කිරීමට පෙලඹෙයි.

නිපුණතාව : 10.0 සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් නිර්මාණ පරිශීලනයෙන් ලබාගත් දැනුම විවිධ භාෂා කාර්ය සඳහා යොදා ගනියි.

නිපුණතා මට්ටම : 10.1 සාහිත්‍යික හා දාර්ශනික තොරතුරු ඇතුළත් ලිපි ලේඛන ඇසුරු කරයි.

කාලච්ඡේද : 5යි

ඉගෙනුම් පල :

- සාහිත්‍යකරුවා පිළිබඳ හඳුනාගත් තොරතුරු ඉදිරිපත් කරයි.
- ලේඛකයාගේ ජීවිතය හා සම්බන්ධ වැදගත් තොරතුරු හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- ලේඛකයකු වශයෙන් ඔහුගේ කුසලතා හඳුනාගෙන අගය කරයි.
- සාහිත්‍යකරුවාගේ චරිතයෙන් ලබාගත හැකි ආදර්ශ නම් කරයි.
- කියවීමෙන් ලබාගත් දැනුම සාහිත්‍යකරණයේ දී ඉවහල් කරගනියි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- පෙළ පොතේ පාඩම කියවීමට යොමු කරන්න.
- පාඩම ඇසුරෙන් කේ. ජයතිලක මහතාගේ චරිතය පිළිබඳ සාකච්ඡාවක් ගොඩ නගන්න.
- සාහිත්‍යකරුවාගේ චරිතයේ සුවිශේෂ ලක්ෂණ හා රසවත් සිද්ධි පෙළ ගස්වන්න.
- ලේඛකයකු වශයෙන් ඔහුගෙන් සිදු වූ සේවය සාකච්ඡා කරන්න.
- කේ. ජයතිලක මහතාගේ ජීවන තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- පුංචි පැළේ ගස වෙනා - කේ. ජයතිලක

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සාහිත්‍යකරුවා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- සාහිත්‍යකරුවාගේ චරිත ලක්ෂණ අගය කරයි.
- ඔහුගේ ජීවන තොරතුරු රැස් කරයි.

නිපුණතාව : 10.0 සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් ලිපි ලේඛන පරිශීලනයෙන් ලබාගත් දැනුම විවිධ භාෂා කාර්යය සඳහා යොදා ගනියි.

නිපුණතා මට්ටම : 10.2 දැනුම ලබා ගැනීම සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් පොත පත කියවයි.

කාලච්ඡේද : 04යි.

ඉගෙනුම් පල :

- ලාංකිකයන් සතු ආහාර තාක්ෂණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- පැරණි ආහාර වර්ග හා ඒ සම්බන්ධ සිරිත්, ජීවන රටා හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- ආහාර හා සම්බන්ධ භාෂාත්මක යෙදුම් හඳුනාගෙන භාවිත කරයි.

පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- පැරණි ආහාර තාක්ෂණය ගැන සාකච්ඡාවක් ගොඩනගන්න.
- ආහාර තාක්ෂණය හා සම්බන්ධ යෙදුම් හඳුනාගෙන භාවිත කිරීමට අවස්ථාව සලස්වන්න.
- පැරණි ආහාර තාක්ෂණය පිළිබඳ තොරතුරු ගවේෂණයට යොමු කරන්න.
- පැරණි ආහාර තාක්ෂණය පිළිබඳ රචනයක් හෝ බිත්ති පුවත්පත් ලිපියක් ලිවීමට යොමු කරන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- එදා හෙළදිව - රොබට් නොක්ස් - පරිවර්තනය - ඒ. පී ගුණරත්න
- 'ආහාර' - සිංහල විශ්ව කෝෂය, 2, 3 කාණ්ඩ

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- පැරණි ආහාර තාක්ෂණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- පැරණි ආහාර නිෂ්පාදන හා සංරක්ෂණ ක්‍රම අගය කරයි.
- ආහාර සම්බන්ධ විශ්වාස, ඇදහිලි, චාරිත්‍ර ආදිය ප්‍රකාශ කරයි.
- ආහාර තාක්ෂණය හා සම්බන්ධ යෙදුම් භාෂා කාර්යයේ දී භාවිත කරයි.

නිපුණතාව : 11.0 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

නිපුණතා මට්ටම : 11.1 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් හඳුනාගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- ජනකතාවේ අන්තර්ගත මානව අත්දැකීම් හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- ජනකතාවෙන් මතු වන ජීවිත ආදර්ශ පැහැදිලි කරයි.
- සාහිත්‍ය නිර්මාණවලට පදනම් වන මානව අත්දැකීම් හඳුනාගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- විවිධ ජනකතා එක් රැස් කිරීමට යොමු වෙයි.

පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- බොහෝ සාහිත්‍ය නිර්මාණවලට මානව අත්දැකීම් පාදක වන බව පෙන්වා දෙන්න.
- පෙළ පොතේ සඳහන් ජන කතාව කියවා ඒවායෙහි අන්තර්ගත වන මානව අත්දැකීම් හඳුනාගැනීමට යොමු කරන්න.
- වෙනත් සාහිත්‍ය නිර්මාණවලින් උදාහරණ ඉදිරිපත් කරමින් සාහිත්‍ය නිර්මාණවලට මානව අත්දැකීම් යොදා ගෙන ඇති අයුරු පැහැදිලි කරන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- ජනකතා - ජාතික අධ්‍යාපන ආයතනය
- මග දිගට ජනකතා - කේ. ඩී. පී. වික්‍රමසිංහ

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:

- සාහිත්‍ය නිර්මාණ කියවා මානව අත්දැකීම් ඉදිරිපත් කරයි.
- සාහිත්‍ය නිර්මාණවලට මානව අත්දැකීම් යොදා ගැනීම අගය කරයි.
- විවිධ සාහිත්‍ය නිර්මාණවලට පාදක වූ මානව අත්දැකීම් හඳුනාගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- මානව අත්දැකීම් පාදක කරගත් සාහිත්‍ය නිර්මාණ කියවීමට යොමු වෙයි.

නිපුණතාව : 11.0 රසඥතාව වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

නිපුණතා මට්ටම : 11.2 සාහිත්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- ජනකවි හා එහි පසුබිම හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- ජනකවි සාහිත්‍යාංගයක් වශයෙන් හඳුනාගෙන අගය කරයි.
- පද්‍ය පන්තිය සඳහා පාදක කවියාගේ අත්දැකීම් පැහැදිලි කරයි.
- ජනකවියෙන් පිළිබිඹු වන සංස්කෘතිය පැහැදිලි කරයි.

පාඩම සැලසුම්කිරීම සඳහා උපදෙස් :

- ජනකවි සාහිත්‍යය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- පෙළපොතේ ඇතුළත් ජනකවි පෙළට සවන්දීමට අවස්ථාව ලබා දෙන්න.
- ජනකවි සඳහා පාදක අත්දැකීම් පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ජනකවියෙන් පිළිබිඹු වන ගැමියාගේ හැඟීම් විස්තර කරන්න.
- ජනකවිවලින් ඉස්මතු වන ගැමි සංස්කෘතිය පිළිබඳ ව තොරතුරු ඉදිරිපත් කරන්න.
- ජනකවි රසාස්වාදය කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- සිංහල ජනකවි සංග්‍රහය - අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- ජනකවි 1 - ජාතික අධ්‍යාපන ආයතනය

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සාහිත්‍යාංගයක් වශයෙන් ජනකවි හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- සාහිත්‍යාංගයක් ලෙස ජනකවි අගය කරයි.
- ජනකවිවලින් නිරූපණය වන සංස්කෘතික ලක්ෂණ අගය කරයි.
- ජනකවි රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

නිපුණතාව : 12.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 12.1 පද්‍ය රචනා නිර්මාණය කරයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- පද්‍ය නිර්මාණය සඳහා සුදුසු තේමා හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- පද්‍ය නිර්මාණය සඳහා සුදුසු කාව්‍යාලංකාර භාවිත කරයි.
- භාෂාව නිර්මාණාත්මක ලෙස භාවිත කිරීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.
- රසවත් කාව්‍ය නිර්මාණය කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- "හා හා හරි හාවා" සහ "හඳපානේ වැලිතලා" ආදි කවි කීපයකට සවන්දීමට සලස්වන්න.
- එම කවිවල තේමා හා විශේෂ ලක්ෂණ හඳුනාගැනීමට ශිෂ්‍යයන්ට මඟ පෙන්වන්න.
- කාව්‍ය නිර්මාණයට උචිත තේමා හඳුනාගැනීමට අවස්ථාව සලස්වන්න.
  - x උදය x සමනලයා
  - x ගඟ x මී මැස්සා
  - x වැස්ස x හාවා

- ශිෂ්‍යයන්ට හඳුනාගැනීමට ලැබුණු සරල තේමා ඔස්සේ කවි නිර්මාණවලට යොමු කරන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා
- ඇස්. මහින්ද හිමියන්ගේ සහ කුමාරතුංග මුනිදාසයන්ගේ ළමා කවි
- නිර්මාණ පසුබිම - ඒ.වී. සුරවීර
- පිඹිත් නළා සුරා මතින් (පරිවර්තනය) - ඒ.වී. සුරවීර

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- කාව්‍ය නිර්මාණය සඳහා සුදුසු තේමා ඉදිරිපත් කරයි.
- කාව්‍ය නිර්මාණය කිරීමට දක්වන හැකියාව අගය කරයි.
- උචිත කාව්‍ය උපක්‍රම භාවිත කරයි.
- රසවත් ලෙස පද්‍ය නිර්මාණය කරයි.

නිපුණතාව : 12.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 12.2 නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- ප්‍රබන්ධකරණය සඳහා සුදුසු අවස්ථා හා සිද්ධි හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- රසවත් ව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- උචිත චරිත, අවස්ථා හා සිද්ධි තර්කානුකූල ව ඉදිරිපත් කරයි.
- ප්‍රබන්ධ නිර්මාණය කරයි.

පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ළමා ප්‍රබන්ධයක කොටසක් පන්තිය ඉදිරියේ කියවීමෙන් හෝ රඟ දැක්වීමෙන් පාඩමට පිවිසෙන්න.
- සාර්ථක ප්‍රබන්ධයක ලක්ෂණ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- නිර්මාණාත්මක ප්‍රබන්ධ සඳහා සුදුසු මාතෘකා තෝරා ගැනීමට මග පෙන්වන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස කුඩා ප්‍රබන්ධයක් නිර්මාණය කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

ගුණාත්මක යෙදවුම් :

- කෙටිකතාවක්
- කතන්දරයක්
- ළමා නවකතාවක කොටසක්

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ප්‍රබන්ධය සඳහා වස්තු බීජයක් ඉදිරිපත් කරයි.
- ප්‍රබන්ධයක් සඳහා සුදුසු ආකෘතියක් ගොඩනගයි.
- චරිත හා සිද්ධි නිර්මාණාත්මක ලෙස ඉදිරිපත් කරයි.
- භාෂාව නිර්මාණාත්මක ව හැසිරවීමේ පරිචය ප්‍රදර්ශනය කරයි.
- සරල ප්‍රබන්ධයක් නිර්මාණය කරයි.

නිපුණතාව : 12.0 අත්දැකීම් පාදක කරගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 12.3 නාට්‍ය පිටපත් රචනයේ යෙදෙයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- නාට්‍ය දෙබසකට සුදුසු සිද්ධියක් තෝරාගෙන ඉදිරිපත් කරයි.
- දෙබස් රචනයේ මූලික ලක්ෂණ හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- නිර්මාණාත්මක ව දෙබස් රචනා කරයි.
- දෙබස් රචනයේ දි නාට්‍යෝචිත භාෂාව යොදා ගනියි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- සුදුසු ළමා නාට්‍යයක කොටසක් නැරඹීමට හෝ කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- නරඹන ලද හෝ කියවන ලද නාට්‍යය පිළිබඳව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- එහි රසවත් සිදුවීමක් ඉස්මතු කර ගන්න.
- එහි රසවත් අවස්ථා හා සිද්ධි සම්බන්ධ දෙබස් අවධානයට ගෙන ඒවායේ නිර්මාණාත්මක බව සාකච්ඡා කරන්න.
- නිර්මාණාත්මක දෙබස් රචනයට අවස්ථාව සලසා දෙන්න.

ගුණාත්මක යෙදවුම් :

- සෝමලතා සුබසිංහගේ ළමා නාට්‍ය
  පුංචි අපට දැන් තේරෙයි
- ළමා නාට්‍ය පිටපත්
- ප්‍රබන්ධෝපදේශය - කුමාරතුංග මුනිදාස

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- නිර්මාණාත්මක දෙබස් රචනයට උචිත සිද්ධියක් තෝරා ගනියි.
- නාට්‍යයක සාර්ථක භාවයට දෙබස් අවශ්‍ය බව පිළිගනියි.
- සජීව ගුණයෙන් යුත් දෙබස් ලියයි.
- දෙබස් රචනයේ දී නාට්‍යෝචිත බස් වහරක් යොදා ගනියි.